# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,374 - 2024 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2024.03.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 304 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 311 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මාර්තු මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මාර්තු මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


301- B 82545— 5,403 (2024/03)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ජාතික සමාජ සංවර්ධන අමාත්‍යාංශය
## (කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

01. තනතුර : **පරිපාලන නිලධාරී-තනතුරු 01**

01. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු.22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

02. අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / වාණිජ / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය / කළමනාකරණය උපාධියක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. 'කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන' (MA I) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | ලකුණු |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | 30 |
| වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 25 |
| මුළු ලකුණු ගණන | 100 |

04. වැටුප් පරිමාණය : JM 1-1 : (රු. 42,600 - 10 x 755 - 18 x 1,135 - රු. 70,580)

02. තනතුර : **සහකාර ලේඛකාධිකාරී - තනතුරු 01**

01. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු.22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

02. අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය / කළමනාකරණය උපාධියක් ලබා තිබීම;

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. 'කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන' (MA I) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | ලකුණු |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | 30 |
| වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 25 |
| මුළු ලකුණු ගණන | 100 |

04. වැටුප් පරිමාණය : JM 1-1 : (රු. 42,600 - 10 x 755 - 18 x 1,135 - රු. 70,580)

03. තනතුර : **ගිණුම් නිලධාරි - තනතුරු 01**

01. වයස්සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු.22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

02. අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2) :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය / වාණිජ / ව්‍යාපාර කළමනාකරණය / කළමනාකරණය උපාධියක් ලබා තිබීම;
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම ;

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. 'කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන' (MA I) සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය

| | ලකුණු |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | 30 |
| වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 25 |
| මුළු ලකුණු ගණන | 100 |

04. වැටුප් පරිමාණය : JM 1-1 : (රු. 42,600 - 10 x 755 - 18 x 1,135 - රු. 70,580)

04. තනතුර : **ඉංග්‍රීසි උපදේශක - තනතුරු 02**

01. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු.22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

02. අධ්‍යාපන සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් (1 හෝ 2 හෝ 3) :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය / ඉංග්‍රීසි පිළිබඳ උපාධිය;

*හෝ*

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමට නොඅඩු මට්ටමක ඉංග්‍රීසි ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම;

*සහ*

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05)ක පළපුරුද්දක් ලබා තිබීම;

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම;

*සහ*

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම;

අභ්‍යන්තර අයදුම්කරුවන් :

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය

| | ලකුණු |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | 30 |
| වෙනත් කාර්යය සාධනයන්/කුසලතා | 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 25 |
| මුළු ලකුණු ගණන | 100 |

04. වැටුප් පරිමාණය : MA 4 - (රු. 37,970 - 10 x 755 - 15 x 930 - 5 x 1,135 - රු. 65,145)

සියළුම තනතුරු සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි -

1. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
2. තනතුර ස්ථිරය.
3. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
4. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

සටහන : මෙම තනතුර පුරප්පාඩුව පවතින්නේ සීදූව ප්‍රධාන කාර්යාලයේ වන අතර තෝරා ගන්නා අය ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතුය.

සේවා කොන්දේසි : 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීතී රීති හා රෙගුලාසිවලට යටත් විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය : පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහලම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ඇතුලත් අයදුම්පත් පහත ලිපිනයට 2024.03.15 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලිපිකවරයේ වම් පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය.

ආචාර්ය රවීන්ද්‍ර විතානච්චි,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
ජාතික සමාජ සංවර්ධන ආයතනය

2024 පෙබරවාරි මස 29 වැනි දින,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)
ජාතික සමාජ සංවර්ධන ආයතනය
ලියනගේමුල්ල,
සීදූව.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**අම්පාර දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 අප්‍රේල් මස 01 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 පෙබරවාරි මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | දෙහිඅත්තකණ්ඩිය | නව මැදගම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා බින්තැන්න පත්තුව දකුණ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

03-43

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

### පුත්තලම දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 අප්‍රේල් මස 01 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 පෙබරවාරි මස 16 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | මහවැව | වලහපිටිය කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ දකුණු පිටිගල් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

03-42

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යලය හෝ

අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2024 අප්‍රේල් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 පෙබරවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කෑගල්ල | රඹුක්කන | රඹුක්කන නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල |

03-41

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024** අප්‍රේල් මස **01** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 පෙබරවාරි මස 16 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | නාරම්මල | දඹදෙනි හත්පත්තුව කොට්ඨාසයේ දඹදෙනිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

03-40

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

### බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර, වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 අප්‍රේල් මස 01** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 ජනවාරි මස 31 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | හාලිඇල | උඩුකිඳ කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |
| බදුල්ල | හාලිඇල | මාලිගාතැන්න කොට්ඨාසයේ උප්පැන්න හා මරණ හා උඩුකිඳ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය. | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

03-04

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

**සැ. යු.-** අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

08. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024 අප්‍රේල් මස 01 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 ජනවාරි මස 31 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | වැලිමඩ | සිල්මියාපුර කොට්ඨාසයේ උප්පැන්න, මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

03-05

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

### බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාග යකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලුදෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි, තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2024 අප්‍රේල් මස 01** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2024 ජනවාරි මස 31 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | ඌවපරණගම | ඌවපරණගම කොට්ඨාසයේ (කෝට්ටගොඩ ප්‍රදේශයේ) මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල |

03-06

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය අමාත්‍යාංශය

### සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය (**MN** 03 -2006 - ඒ) දෙපාර්තමේන්තුගත තනතුරුවල **III** වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති රෝහල් හා ආයතනවල අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය (MN - 03) දෙපාර්තමේන්තුගත පහත තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අ/අ | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කාර්මික නිලධාරී (සිවිල්) | 07 |
| 02 | කාර්මික නිලධාරී (විදුලි) | 03 |

02. අවශ්‍ය සුදුසුකම්

2.1. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :

| *අ/අ* | *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|
| 01 | කාර්මික නිලධාරී (සිවිල්) | (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබීම;<br>*හෝ*<br>ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 03 ලබා තිබීම;<br>*සහ*<br>(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම.);<br>*හෝ*<br>ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 04 ලබා තිබීම. | (i) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්);<br>*හෝ*<br>(ii) ජාතික අධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (සිවිල්);<br>*හෝ*<br>(iii) විවෘත විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්);<br>*හෝ*<br>(iv) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්);<br>*හෝ*<br>(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව. (සිවිල්);<br>*හෝ*<br>(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 හෝ 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම. |
| 02 | කාර්මික නිලධාරී (විදුලි) | (අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා/පෙළ) විභාගය සමත්ව තිබීම;<br>*හෝ*<br>ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 03 ලබා තිබීම<br>*සහ* | (i) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (විදුලි);<br>*හෝ*<br>(ii) ජාතික අධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (විදුලි);<br>*හෝ*<br>(iii) විවෘත විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (විදුලි);<br>*හෝ* |

| අ/අ | තනතුර | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| | | (ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම.);<br>*හෝ*<br>ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 04 ලබා තිබීම. | (iv) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි);<br>*හෝ*<br>(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව. (විදුලි);<br>*හෝ*<br>(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 හෝ 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම. |

2.2. කායික සුදුසුකම්ඃ - සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

2.3. වයසඃ අවුරුදු 18 නොඅඩු - අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

2.3. වෙනත් ඃ-

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. බඳවා ගැනීමේ ලිඛිත විභාගය ඃ

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම | ලෝකයේ, ශ්‍රී ලංකාවේ කාලීනව වැදගත් වන්නා වූ සංස්කෘතික, සමාජීය, ආර්ථික, දේශපාලනික, තාක්ෂණික, විද්‍යාත්මක, ක්‍රීඩා හා පාරිසරික ක්ෂේත්‍රයන්හි සිද්ධීන් සම්බන්ධ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන පොදු ප්‍රශ්න පත්‍රයකි. | පැය 02 | 100 | 40% |
| 2. තාක්ෂණ දැනුම | එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් වන තාක්ෂණික දැනුම සහිත ප්‍රශ්න පත්‍රයකි. ඒ සඳහා වන විෂය නිර්දේශය පහත දැක්වේ. | පැය 1 1/2 | 100 | 40% |
| | | | | |

| *තනතුර* | *තාක්ෂණ දැනුම විෂය නිර්දේශය* |
|---|---|
| 01. කාර්මික නිලධාරි (සිවිල්) | 1. Concrete<br>Concrete මිශ්‍රණ<br>Concrete මිශ්‍රණ වර්ග හා ඒ අනුව යෙදුම් කරන තැන්<br>Concrete Curing කරන ආකාරය<br>Concrete mix කරන ආකාරය<br>Concrete mix කිරීමට යොදා ගන්නා machines (Vibrator, Mixing Drum)<br>Concrete වල ප්‍රමිතිය පරීක්ෂාව (Slump Test / Cube Test) |

| තනතුර | තාක්ෂණ දැනුම විෂය නිර්දේශය |
|---|---|
| | 2. වහල<br>සිවිලිම් වර්ග (Asbestos වහල)<br>වහල<br>උළු වහල<br>ඇස්බැස්ටස් වහල<br>3. පින්තූරයක් ආශ්‍රයෙන් Volume area ගණනය කිරීම<br>4. Contraction සඳහා යොදා ගන්නා ලී වර්ග, ලී වර්ග වල යෙදීම් ආරක්ෂණ ක්‍රම<br>5. බිත්ති පොළොව සඳහා කරන Finishing<br>Plastering - Plastering වල සංයුතිය<br>Plastering යොදන තැන්<br>Tiling - Tile වර්ග<br>Painting - Paint වර්ග හා ඒවා යොදා ගන්නා තැන් |
| 02. කාර්මික නිලධාරි (විදුලි) | 1. විදුලි ආරක්ෂණය<br>2. විදුලි උපාංග<br>I.<br>a) මිහිකාන්දු පරිපථ බිඳිනය (Residual Current Circuit Breaker - RCCB)<br>b) සිඟිති පරිපථ බිඳිනය (Miniature Circuit Breaker - MCB)<br>c) බිම් කාන්දු පරිපථ බිඳිනය (Earth Leakage Circuit Breaker - ELCB)<br><br>II.<br>a) Timers<br>b) Relays<br>c) Cont actors<br>d) Overload Protection<br>e) Direct on - line Starter<br>f) Star - Delta Conveter<br>III. ගෘහ පරිපථකරණය |

04. වැටුප් ව්‍යුහය හා වැටුප් පරිමාණය මාසික ඃ

රු. 31,040-10x445-11x660-10x730-10x750 -රු. 57,550
MN3-2006 -(ඒ) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 උපලේඛන (i) අනුව)

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි ඃ-

(i) බඳවා ගනු ලබන නිලධාරින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.

(ii) පත්කරනු ලබන තනතුර ස්ථිරය. තෝරාගත් අයදුම්කරුවන්ට හිමි විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(iii) මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර බඳවාගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධානවලට ද සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණය (MN 03-2006 -ඒ)සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියට ද සෞඛ්‍ය ලේකම් විසින් නිකුත් කරන චක්‍රලේඛ හා පොදු විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

(vi) ඔබ පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

06. අයදුම් කළයුතු ක්‍රමය :-

(අ) අයදුම්කරුවන් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙළ කර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN 3-2006 -ඒ) සේවා ගණයේ දෙපාර්තමේන්තුගත ........................... ..... (ඉල්ලුම් කරන තනතුරේ නම සඳහන් කරන්න.) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත - 2024" යනුවෙන් සඳහන් කර **2024.03.22** දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 07 ශාඛාව, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : **2024.03.22**

(ඇ) විභාග ගාස්තුව රු. 1,000.00 කි. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ සෞඛ්‍ය ලේකම් නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි දක්වා ඇති කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු නොගෙවනු ලබන අතර අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවන ලද රිසිට්පතෙහි පිටපතක් ළඟ තබා ගැනීම සුදුසු ය. (මුදල් ඇනවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

(ඈ) අයදුම්පත පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(ඉ) අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස් වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකීය රියදුරු බලපත්‍රය

එමෙන් ම විභාග ශාලාවට ඇතුළුවීමේ දී අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය තහවුරු කර හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාව වෙත ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාව වෙත ඇතුළත් කර නොගැනේ. තවද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය. ඊට අමතරව විභාගය සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වෙනත් උපදෙස් විභාග ප්‍රවේශ පත්‍රය මගින් ඔබට දන්වනු ලැබේ. විභාගය සම්බන්ධව වූ මෙම නියමයන්ට පටහැනිව කටයුතු කරන අයදුම්කරුවන් විභාග ශාලාව තුළට ඇතුළු කර නොගැනීම/විභාග ශාලාවෙන් ඉවත් කිරීමේ බලය විභාග ශාලාධිපති සතුවේ.

08. අත්සන සහතික කිරීම :-

රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාර වරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ /අධ්‍යාපන පරිපාලන සේවයේ /රජයේ ගණකාධිකාරි සේවයේ රු.240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන සහතික කර තිබිය යුතුය.

09. සාවද්‍ය තොරතුරු සැපයීම :-

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහකිරීමට කටයුතු කරනු ලැබේ.

10. විභාග කොන්දේසිඃ-

(i) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් විභාගයෙන් ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුවද පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

(ii) තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් එක් එක් තනතුරට වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වන අතර එක් ලිපි කවරයක එක තනතුරකට අදාළ අයදුම්පත පමණක් බහා එවිය යුතුය.

(iii) මේ සමග ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iv) අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

(v) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරග විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

(vi) බඳවා ගැනීමේ තරග විභාගය බුද්ධි පරීක්ෂණය හා සමාන්‍ය දැනීම සහ තාක්ෂණික දැනුම යන ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් තාක්ෂණික දැනුම සහිත ප්‍රශ්න පත්‍රයක් සකස් කරනු ලැබේ.

(vii) ඉහත පරීක්ෂණ දෙකෙන් ම සමත් වූවන් පමණක් බඳවා ගැනීමේ විභාගය සමත්වූවන් ලෙස සලකනු ලැබේ. තරග විභාගයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතාවය අනුව සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද නිලධාරීන් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින රෝහල් හා ආයතනවල පුරප්පාඩු සඳහා පත් කිරීමට නියමිතය.

(viii) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පමණක් පිළිතුරු දිය යුතුය.

*සැලකිය යුතුය* :-

(අ) අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිවැරදි බව පිළිබඳ සහතික විය යුතුය.

(ආ) අයදුම්පතට කිසියම් ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවල දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂයකගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ. එසේ නොමැතිව අයදුම්පත්‍රයට කිසිසේත් සම්බන්ධ නොවන ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ඇ) අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපැලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම දරාගත යුතුය.

(ඈ) එකම ලිපිකවරයක් මගින් අයදුම්පත්‍ර කිහිපයක් යොමු කර ඇති විටෙක ලිපිකවරයේ දක්වා ඇති තනතුර සඳහා පමණක් විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබා දෙන අතර සෙසු අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඉ) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, තනතුරු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ඊ) තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනයෙන් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. එසේම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් හෝ පරස්පරතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

වෛද්‍ය පී.ජී. මහීපාල,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2024 පෙබරවාරි මස 17 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN 03 -2006 -ඒ) තනතුරු සඳහා
III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : ☐ පදිංචි දිස්ත්‍රික්කය : ☐
(සිංහල -S, දෙමළ - T, ඉංග්‍රීසි - E)
(අදාළ ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න) අයදුම් කරනු ලබන තනතුර : ☐

01.
(i). මුලකුරු සමග නම :————.
(සිංහලෙන් / දෙමළෙන්)

(ii) සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

(iii) මුලකුරු සමග නම :- Mr./Mrs./Miss :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :- Mr. SILVA A.B.

(iv) සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. පදිංචි ලිපිනය :
(i) ස්ථිර පදිංචි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ii) ස්ථිර පදිංචි ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

03. උපන් දිනය :-

| වර්ෂය | | | | | මාසය | | | දිනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

3.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :-

| වර්ෂ | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. දුරකථන අංකය : පෞද්ගලික (ජංගම) :————. ස්ථාවර :————.

06. විද්‍යුත් ලිපිනය :————.

07. ස්ත්‍රී / පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

08. ශ්‍රී ලංකා පුරවැසියෙකු ද යන්න බව :- ඔව් ☐ නැත ☐

09. විවාහක / අවිවාහක බව :————.

10. අධ්‍යාපන සුදුසුකම් :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ඃ

වර්ෂය :————. විභාග අංකය :————.

| අ/අ | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ඃ

වර්ෂය :————. විභාග අංකය :————.

| අ/අ | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

(ඇ) වෘත්තීය හා කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර ඃ

| සහතිකය | නිකුත්කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(වෘත්තීය හා කාර්මික සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න.)

(ඇ) වෙනත් විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද ඃ

..........................................................................................................

..........................................................................................................

11. ඔබ යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක දී වරදකරු වී තිබේ ද ?

(ඔව් නම් විස්තර සපයන්න) :-

..........................................................................................................

..........................................................................................................

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :-

I. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.

II. ගෙවූ මුදල :————.

| |
|---|
| ලංකා බැංකු ශාඛාවකට රු. 1000.00 මුදල ගෙවා ලබා ගත් රිසිට්පත නොගැළවෙන සේ මෙහි අලවන්න (අයදුම්පතෙහි සහ ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

13. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදි වූත් තොරතුරු බවට ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයා ගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බව ද, තෝරා ගැනීමෙන් පසුව නම් යම් කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බව ද පිළිගනිමි.

————,

අයදුම්කරුගේ අත්සන

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු / ඇය මා ඉදිරිපිට දී .................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,

සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන ලද නිලධාරියාගේ,
සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

15. දැනට රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ කටයුතු කරන *ගැසට්* නිවේදනයේ දක්වා ඇති මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට පමණක් පහත කරුණු අදාළ වේ.

15.1. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු විස්තරය

i. නිලධාරියාගේ නම :————.

ii. ස්ථිර සේවා ස්ථානය හා ලිපිනය :————.

iii. ස්ථිර සේවා ස්ථානයේ දුරකථන අංකය :————.

iv. නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය :————.

v. විභාගයට අයදුම්කරන අවස්ථාවේ දී දරන තනතුර :————.

vi. එම තනතුරට පත්වීම් ලැබූ දිනය :————.

vii. එම තනතුරේ ස්ථිර කර තිබේ ද? ("ඔව්" නම් ස්ථිර කරන ලද දිනය සඳහන් කරන්න) :————.

viii. සේවා කාලය තුළ දී විනයානුකූල දඬුවම් ලබා තිබේ ද? ("ඔව්" නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න) :————.

ix. මේ වනවිට විනයානුකූලව දඬුවමකට යටත් කොට තිබේ ද? ("ඔව්" නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න) :————.

x. දැනට විනයානුකූල පරීක්ෂණ පැවැත්වෙන්නේ ද? ("ඔව්" ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න) :————.

මෙම අයදුම්කරුවන ........................................ මයා / මිය / මෙනවිය ආයතනයේ .......................... වැනි දින සිට .............................. (තනතුර සඳහන් කරන්න) සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි. ඉහත 15 කරුණ යටතේ සඳහන් කර ඇති සියල්ල මෙම කාර්යාලයේ ඇති වාර්තා අනුව පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හරින / නොහරින බවත් මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා අත්සන.

අත්සන :————.
නම :————.
පදවි නාමය :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව / ආයතනය :————.
(රබර් මුද්‍රාවෙන් සනාථ කරන්න)

03-17

---

**ජනාධිපති කාර්යාලය**

අධ්‍යාපන කටයුතු සඳහා ආර්ථික අපහසුතා සහිත 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන - 2024/2025

දිවයිනේ සෑම පාසලක් ම ආවරණයවන පරිදි අධ්‍යාපනික සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා දක්ෂතා දක්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයකට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ජනාධිපති අරමුදල මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම වැඩසටහන, දිවයිනේ පවතින රජයේ පාසල් 10,126 ම (2022 වාර්ෂික සංගණන වාර්තාව - අධ්‍යාපන අමාත්‍යාංශය) ආවරණයවන පරිදි ක්‍රියාත්මක කිරීමට නියමිත අතර මේ යටතේ එක් පාසලකට පිරිනැමෙන උපරිම ශිෂ්‍යත්ව සංඛ්‍යාව (එක් එක් පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන) විදුහල්පතිවරු වෙත දන්වා ඇත. ඒ අනුව විදුහල්පතිවරුන් විසින් තම පාසලට අදාළ ශිෂ්‍යත්ව සංඛ්‍යාව තීරණය කර ශිෂ්‍යත්වලාභීන් තෝරාගැනීම සිදු කරනු ලබයි. මේ සඳහා සුදුසුකම් ලබන ශිෂ්‍යත්වලාභීන්ට වසරක් පුරා මසකට රු.3,000/- බැගින් මාස 12ක උපරිම කාලසීමාවක් සඳහා එම ශිෂ්‍යාධාර මුදල ලබා දීමට නියමිත ය. මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු ජනාධිපති අරමුදලේ නිල Facebook පිටුව වන www.facebook.com/president.fund සහ ජනාධිපති අරමුදලේ www.presidentsfund.gov.lk හා අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk යන වෙබ් අඩවිවලින් ලබාගත හැක.

ඒ සඳහා වූ උපදෙස් පත්‍රිකාව සහ අයදුම්පත්‍රය පහත දක්වා ඇත.

ජනාධිපති ලේකම්.

## උපදෙස් පත්‍රිකාව

*සුදුසුකම් :*

- 1 ශ්‍රේණියේ සිට 05 ශ්‍රේණිය දක්වා අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම 50% හෝ ඊට වැඩි හෝ ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වීම.

  6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශ්‍රේණිවල, 2023 වසරේ දී පැවති අවසාන වාර පරීක්ෂණය අනුව 1 - 20 දක්වා ස්ථානයන් ලබාගන්නා ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වීම.

  *සැ.යු.* :- 2024 වර්ෂයේ 1 ශ්‍රේණියට ඇතුළත් වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ 2024 වර්ෂයේ පැවැත්වීමට නියමිත 2023 අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට මේ සඳහා අයදුම්කළ නොහැකි ය.

- රජයේ පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයෙක්/ ශිෂ්‍යාවක් වීම.

- ශිෂ්‍ය ශිෂ්‍යාවගේ පවුලේ මාසික ආදායම රුපියල් 100,000/= නොඉක්ම වීම.

*අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සහ භාර දීම :*

- අයදුම්පත්‍රයේ I කොටස සහ II කොටසේ අංක 01 සිට 05 දක්වා කොටස් ශිෂ්‍යයා/ශිෂ්‍යාව විසින් සම්පූර්ණ කළ යුතු අතර ලකුණු ලබා දීම ද ශිෂ්‍ය ශිෂ්‍යාව විසින් ම සිදු කල යුතු ය. අදාළ ලකුණු විදුහලේ තේරීම් කමිටුව විසින් පරීක්ෂා කර සහතික කල යුතුය.

*සැ.යු* :- 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ශිෂ්‍යයා/ශිෂ්‍යයාවගේ අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම අනුව පන්තිභාර ගුරුවරයා/ගුරුවරිය විසින් නිවැරදි ලකුණු ලබාදීම සිදු කළ යුතුය.

- සෑම විට ම නිවැරදි ම තොරතුරු ඇතුළත් කල යුතුය.

- කෙටි පණිවුඩ යැවීමට හැකි දුරකථන අංකයක් සඳහන් කළ යුතුය. ඔබ වෙත එවැනි දුරකථන අංකයක් නොමැති නම්, පවුලේ ලඟම ඥාතියෙකුගේ/ පාසලේ ගුරුවරයකුගේ/ විදුහල්පතිතුමාගේ දුරකථන අංකයක් ඔවුන්ගේ එකඟතාවය සහිතව ලබා දීමට කටයුතු කල යුතුය.

- පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳව තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගේ සහතිකය ද, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ද (ආදායම් වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නොවේ) සමගින් සම්පූර්ණ කරන ලද අයදුම්පත තම පාසලේ විදුහල්පති වෙත පමණක් අතින් භාර දිය යුතුය.

විදුහල්පති විසින් තම පාසලට උපරිම ශිෂ්‍යත්වලාභීන් ගණන තෝරාගත් බව දැනුම් දුන් පසු එම ශිෂ්‍යත්වලාභියාගේ මව/පියා/භාරකරුගේ හවුල්කාරිත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක්) සක්‍රිය ගිණුමක් මහජන බැංකුවේ හෝ ලංකා බැංකුවේ ශාඛාවකින් විවෘත කර, එම ගිණුමේ තොරතුරු සඳහන් පිටුවේ සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙ හි පැහැදිලි ඡායා පිටපතක් විදුහල්පති වෙත ඉදිරිපත් කළ යුතුය. එම ඡායා පිටපත් විදුහල්පති විසින් සහතික කළ යුතුය.

*සැ. යු.* :- කෙසේ වුව ද විදුහල්පති විසින් ශිෂ්‍යත්වලාභියෙකු ලෙස තෝරාගත් බව දන්වන තෙක් බද්ධ ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය නැත.

- කිසිඳු අවස්ථාවක අයදුම්පත් ජනාධිපති කාර්යාලයට හෝ ජනාධිපති අරමුදල වෙත ගෙනවිත් භාර දීම හෝ තැපැල මගින් යොමු නොකළ යුතුය.

01. *ලකුණු ලබා දීමේ ක්‍රමවේදය* - සියලු ශ්‍රේණි සඳහා -

1. පවුල සම්බන්ධ තොරතුරු :
දෙමව්පියන්ගෙන් යැපෙන වයස අවුරුදු 21ට අඩු පවුලේ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සහ දෙමව්පියන් පිළිබඳ විස්තර

| | | *ලකුණු* |
|---|---|---|
| 1.1 | ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමග සහෝදර සහෝදරියන් සංඛ්‍යාව දෙදෙනෙකු වූ විට | 03 |
| 1.2 | ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමග සහෝදර සහෝදරියන් සංඛ්‍යාව තිදෙනෙකු වූ විට | 04 |
| 1.3 | ශිෂ්‍යයා/ශිෂ්‍යාව සමග සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සිව්දෙනෙකු හෝ ඊට වැඩි වූ විට | 05 |
| 1.4 | ශිෂ්‍යයාට/ශිෂ්‍යාවට දෙමව්පියන් දෙදෙනාගේ ම රැකවරණය අහිමි වීම | 10 |
| 1.5 | දෙමව්පියන්ගෙන් එක් අයෙකුගේ රැකවරණය අහිමි වීම | 05 |
| 1.6 | ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවක දී<br>(අර්ධ දුබලතාවක් නම් ලකුණු 05 ක් පමණක් ලබා දෙන්න) | 10 |

(උපරිම ලකුණු 25)

*සැ.යු.* :- ඉහත 1.4 හි දෙමව්පියන් දෙදෙනාම රැකවරණය අහිමි නම් උපරිම ලකුණ 10ක් හිමිවන අතර, 1.5 හි දෙමව්පියන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ රැකවරණය අහිමිවීම නම් ලකුණු 05ක් පමණක් හිමි වේ.

සහෝදර සහෝදරියන් ලෙස සලකනු ලබන්නේ දෙමව්පියන්ගෙන් යැපෙන අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන් ය. ශාරීරික දුබලතාවය, පූර්ණ දුබලතාවක් ද *නැතහොත්* අර්ධ දුබලතාවක් ද යන්න පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

02. *ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය* :

2.1. 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා පමණි.

2.1.1. 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍යයා/ශිෂ්‍යාවන් ළඟා කරගත් අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම

| *ළඟා කර ගත් මට්ටම* | *ලකුණු* |
|---|---|
| 100% | 50 |
| 75% | 40 |
| 50% | 30 |
| (උපරිම ලකුණු 50) | |

2.1.2 *විෂය සමගාමී ක්‍රියාකාරකම්* :

පාසල් මට්ටමින් ක්‍රියාත්මක මළල ක්‍රීඩා/ චෙස්/ පිහිණුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ පරිසර ළමා සමාජ/ වාදනය/ ගායනය/ චිත්‍ර/ නැටුම්/ පෝතක බාලදක්ෂ/ කුඩා මිතුරි සහ වෙනත් අනුමත විෂය සමගාමී ක්‍රියාකාරකම් :

| *ස්ථානය* | *පාසල් මට්ටම* |
|---|---|
| පළමුවන ස්ථානය | ලකුණු 08 |
| දෙවන ස්ථානය | ලකුණු 07 |
| තුන්වන ස්ථානය | ලකුණු 06 |
| (උපරිම ලකුණු 08) | |

*සැ.යු.* :- ඉහත 2.1.2 හි දී, එක් ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීමේ දී සාමූහික ක්‍රියාකාරකම් සඳහා ද ලකුණු ලබා දෙනු ලැබේ.

2.2. 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යයා/ශිෂ්‍යාවන් සඳහා පමණි.

2.2.1. ශිෂ්‍යයා/ශිෂ්‍යාව 2023 වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී ලබා ඇති ස්ථානය ඃ

| | |
|---|---|
| 01 වන ස්ථානය සිට 03 වන ස්ථානය දක්වා | ලකුණු 50 |
| 04 වන ස්ථානය සිට 06 වන ස්ථානය දක්වා | ලකුණු 45 |
| 07 වන ස්ථානය සිට 10 වන ස්ථානය දක්වා | ලකුණු 40 |
| 11 වන ස්ථානය සිට 15 වන ස්ථානය දක්වා | ලකුණු 35 |
| 16 වන ස්ථානය සිට 20 වන ස්ථානය දක්වා | ලකුණු 30 |
| (උපරිම ලකුණු 50) | |

2.2.2. විෂය සමගාමී ක්‍රියාකාරකම් ඃ (ක්‍රීඩා, සෞන්දර්ය සහ වෙනත්)

පාසල් මට්ටමින් ක්‍රියාත්මක තනි/ කණ්ඩායම් ක්‍රීඩා සහ මළල ක්‍රීඩා, විෂය සමගාමී ක්‍රියාකාරකම් (සමිති සමාගම් යනාදිය ද ඇතුළත් ව) ආදිය මගින් ලබා ඇති ජයග්‍රහණ -

| | *පාසල් මට්ටම* | *කලාප මට්ටම* | *පළාත් මට්ටම* | *ජාතික මට්ටම* |
|---|---|---|---|---|
| පළමුවන ස්ථානය | 05 | 06 | 07 | 08 |
| දෙවන ස්ථානය | 04 | 05 | 06 | 07 |
| තුන්වන ස්ථානය | 03 | 04 | 05 | 06 |
| | | | | (උපරිම ලකුණු 08) |

*සැ.යු.* ඃ-

- එක් අවුරුද්දකට පමණක් ලකුණු ලබා දීමට යටත් ව, ආසන්න පසුගිය වසර 03 ක් සලකා බැලීම සුදුසුය.
- ඉහත 2.2.2 හි දී, එක් ශිෂ්‍යයෙකුට/ශිෂ්‍යාවකට එකම විෂය සමගාමී ක්‍රියාකාරකමක් සඳහා ජාතික, පළාත්, කලාප සහ පාසල් යන මට්ටම් තුනේ ම අනුයාත වසර 03 කට අදාළ ව ජයග්‍රහණ පවතී නම් ලකුණු දීමේ දී සැලකිල්ලට ගත යුත්තේ ඉහළම ලකුණු මට්ටම පමණි.

03. *ශිෂ්‍ය නායකත්වය - සියලු ශ්‍රේණි සඳහා -*

පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක - ලකුණු 07
ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ) - ලකුණු 06
පන්ති නායක - ලකුණු 05
(උපරිම ලකුණු 07)

*සැ.යු.* ඃ- ඉහත 03 හිදී ලකුණු දීමේ දී සැලකිල්ලට ගත යුත්තේ ඉහළම මට්ටම් පමණි.

04. *ශිෂ්‍යයා/ශිෂ්‍යාව දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම. - සියලු ශ්‍රේණි සඳහා -*

(දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් නිකුත් කළ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.)

දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම. ලකුණු 10
(වසරකට වැඩි කාලයක් දහම් අධ්‍යාපනය ලැබීම සහ
මේ වන විටත් දහම් පාසලක ශිෂ්‍ය ශිෂ්‍යාවක ලෙස කටයුතු කිරීම.)
(උපරිම ලකුණු 10)

- සියලු ලියාපදිංචි ආගමික දහම් පාසල් මේ යටතට අයත් වේ.

ඔබට තවදුරටත් තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් පහත සඳහන් විද්‍යුත් ලිපිනයට (E-mail) පණිවිඩයක් යොමු කිරීම මගින් හෝ දුරකතන අංක වෙත ඇමතුමක් ලබාදීම මගින් සිදුකළ හැකිය.

විද්‍යුත් ලිපිනයට (Email) : pfschol@presidentsoffice.lk
011-2 354 354 - දිගු අංක : 4830/4835/4837
074-085 4527 (WhatsAPP මගින් යොමු වන පණිවුඩ පමණි)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :- [ ]

**අධ්‍යාපන කටයුතු සඳහා ආර්ථික අපහසුතා සහිත 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මගින් පිරිනමන ජනාධිපති ශිෂ්‍යත්ව සඳහා වූ අයදුම්පත්‍රය - 2024/2025**

(කරුණාකර අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර උපදෙස් පත්‍රිකාව බලන්න.)

I කොටස

පළාත :————. දිස්ත්‍රික්කය :————. අධ්‍යාපන කලාපය :————.

01 ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ පෞද්ගලික තොරතුරු

1.1 ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ මුලකුරු සමග නම (සිංහලෙන්) :————.

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම(සිංහලෙන්) :————.

1.3 මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) :————.

1.4 අධ්‍යාපනය ලබන පාසලේ නම :————.

1.5 ඉගෙනුම ලබන ශ්‍රේණිය :————.

1.6 උපන් දිනය : [ | | | ] [ | ] [ | ] (අවු. මාස. දින )

1.7 මව /පියා/භාරකරුගේ නම :————.

1.8 මව /පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | | | ]

1.9 දුරකතන අංකය (කෙටි පණිවුඩ යැවිය හැකි) : [0|7| | | | | | | | ]

1.10 දුරකතන අංකය (සම්බන්ධ කරගත හැකි) : [ | | | | | | | | | ]

1.11 පෞද්ගලික ලිපිනය (සිංහල) :————.

1.12 පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි) :————.

II කොටස

01. පවුල සම්බන්ධ තොරතුරු - සියලු ශ්‍රේණි සඳහා
දෙමව්පියන්ගෙන් යැපෙන වයස අවුරුදු 21ට අඩු පවුලේ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සහ දෙමව්පියන් පිළිබඳ විස්තර

| | | ලකුණු |
|---|---|---|
| 1.1 | ශිෂ්‍යයා/ ශිෂ්‍යාව ඇතුළුව සහෝදර සහෝදරියන් සංඛ්‍යාව දෙදෙනෙකු වූ විට | |
| 1.2 | ශිෂ්‍යයා/ ශිෂ්‍යාව ඇතුළුව සහෝදර සහෝදරියන් සංඛ්‍යාව තිදෙනෙකු වූ විට | |
| 1.3 | ශිෂ්‍යයා/ ශිෂ්‍යාව ඇතුළුව සහෝදර සහෝදරියන් සංඛ්‍යාව සිව් දෙනෙකු හෝ ඊට වැඩි වූ විට | |
| 1.4 | ඔබ, මව්පිය දෙදෙනාගේම රැකවරණය යටතේ සිටින්නේද? ඔව්/නැත | |
| 1.5 | ඔබ, මව හෝ පියා යන දෙදෙනාගෙන් එක් අයෙකු යටතේ පමණක් රැකවරණයේ සිටින්නේද?......................පමණක් සිටී. | |
| 1.6 | ඔබ, ශාරීරික දුබලතාවකින් පෙළෙන්නේද? ඔව්/නැත ඔව් නම් ඒ දුබලතාව කුමක්ද? ............................................................ | |
| | එකතුව | |

එකතුව [ ]

(උපරිම ලකුණු සංඛ්‍යාව 25 කි.)

02 ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය

2.1 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ශිෂ්‍යශිෂ්‍යාවන් සඳහා පමණි.

2.1.1 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍යයා/ශිෂ්‍යාවන් ලඟා කරගත් අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම

| ලඟා කරගත් මට්ටම | ලකුණු |
|---|---|
| 100% | |
| 75% | |
| 50% | |

(උපරිම ලකුණු සංඛ්‍යාව 50)

2.1.2 පාසල් මට්ටමින් ක්‍රියාත්මක මළල ක්‍රීඩා/ චෙස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ පරිසර ළමා සමාජ/ වාදනය/ගායනය/ චිත්‍ර/නැටුම්/ පෝතක බාලදක්ෂ/ කුඩා මිතුරි සහ වෙනත් අනුමත විෂයය සමගාමී ක්‍රියාකාරකම්

| විෂයය සමගාමී ක්‍රියාකාරකම් | පාසල් මට්ටම | | |
|---|---|---|---|
| | 1 වන ස්ථානය | 2 වන ස්ථානය | 3 වන ස්ථානය |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| | | එකතුව | |

(උපරිම ලකුණු සංඛ්‍යාව 08)

2.2 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යයා/ශිෂ්‍යාවන් සඳහා පමණි.
2.2.1 ශිෂ්‍යයා/ ශිෂ්‍යාව 2023 වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී ලබා ඇති ස්ථානය

| ස්ථානය | අයදුම්කරු ලබාගත් ස්ථානය | ලකුණු |
|---|---|---|
| 01 වන ස්ථානයේ සිට 03 වන ස්ථානය දක්වා | | |
| 04 වන ස්ථානයේ සිට 06 වන ස්ථානය දක්වා | | |
| 07 වන ස්ථානයේ සිට 10 වන ස්ථානය දක්වා | | |
| 11 වන ස්ථානයේ සිට 15 වන ස්ථානය දක්වා | | |
| 16 වන ස්ථානයේ සිට 20 වන ස්ථානය දක්වා | | |
| | එකතුව | |

(උපරිම ලකුණු සංඛ්‍යාව 50 කි.)

2.2.2 විෂයය සමගාමී ක්‍රියාකාරකම් (ක්‍රීඩා/ සෞන්දර්යය සහ වෙනත්)

පාසල් මට්ටමින් ක්‍රියාත්මක තනි/ කණ්ඩායම් ක්‍රීඩා සහ මළල ක්‍රීඩා, විෂයය සමගාමී ක්‍රියාකාරකම් (සමිති සමාගම් යනාදිය ද ඇතුළත් ව) ආදිය මගින් ලබා ඇති ජයග්‍රහණ

| ක්‍රීඩා, සෞන්දර්යය සහ වෙනත් | පාසල් මට්ටම (උපරිම ලකුණු 05) | | කලාප මට්ටම (උපරිම ලකුණු 06) | | පළාත් මට්ටම (උපරිම ලකුණු 07) | | ජාතික මට්ටම (උපරිම ලකුණු 08) | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය | 1 වන ස්ථානය | 2 හෝ 3 වන ස්ථානය |
| 1. | | | | | | | | |
| 2. | | | | | | | | |
| 3. | | | | | | | | |
| | | | | | | එකතුව | | |

(උපරිම ලකුණු සංඛ්‍යාව 08 කි.)

03. ශිෂ්‍යනායකත්වය - සියලු ශ්‍රේණි සඳහා

| | | ලකුණු |
|---|---|---|
| 01 | පාසල් ප්‍රධාන ශිෂ්‍ය නායක/පාසල් උපප්‍රධාන ශිෂ්‍ය නායක | |
| 02 | ශිෂ්‍ය නායක (කනිෂ්ඨ/ජ්‍යෙෂ්ඨ) | |
| 03 | පන්ති නායක | |
| | එකතුව (උපරිම ලකුණු සංඛ්‍යාව 07 කි.) | |

04. ශිෂ්‍යයා/ ශිෂ්‍යාව දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම. - සියලු ශ්‍රේණි සඳහා
(දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් නිකුත් කළ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.)

| | | ලකුණු |
|---|---|---|
| 01 | දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම | |

(උපරිම ලකුණු සංඛ්‍යාව 10කි.)

05. ලකුණු සාරාංශය

| | | |
|---|---|---|
| 01 | පවුල සම්බන්ධ තොරතුරු | |
| 02. | ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය | |
| | 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා<br>■ අභිමත ඉගෙනුම් නිපුණතා මට්ටම<br>■ විෂයය සමගාමී ක්‍රියාකරකම් | |
| | 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා<br>■ අවසාන වාර පරීක්ෂණයේ දී ලබා ඇති ස්ථානය<br>■ විෂයය සමගාමී ක්‍රියාකරකම් | |
| 03. | ශිෂ්‍ය නායකත්වය | |
| 04. | ශිෂ්‍යයා/ ශිෂ්‍යාව දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම. | |

ලබාගෙන ඇති මුළු ලකුණු සංඛ්‍යාව ☐

ඉහත දැක්වෙන කරුණු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. අවශ්‍ය අවස්ථාවක දී අදාළ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට එකඟ වෙමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

————,
මව/පියා/භාරකරුගේ නම සහ අත්සන.

අයදුම්කරු විසින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

දිනය :————.

————,
පන්තිභාර ගුරුවරයා/ගුරුවරියගේ නම සහ අත්සන.

පවුලේ මාසික ආදායම පිළිබඳ ප්‍රකාශය :-

(මව/පියා/භාරකරු විසින් සම්පූර්ණ කළයුතුය.)

මම .............................. රැකියාව කරමි./ රැකියාවක් නොකරමි.
(රැකියාව කුමක්ද? යන්න)
මගේ ස්වාමිපුරුෂයා/භාර්යාව .............................. ආයතනයේ රැකියාව කරනු ලබයි./ රැකියාවක් කරනු නොලබයි.

අප පවුලේ මාසික ආදායම රුː ............... බව ද ප්‍රකාශ කරමි.

————————,
මව/පියා/භාරකරුගේ අත්සන

දිනය :————. නම :————.

ඉහත සඳහන් ආදායම පිළිබඳ කරුණු නිවැරදි බව සහතික කරමි.

————————,
ග්‍රාම නිලධාරිගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය :————.

ඉහත ආදායම පිළිබඳ කරුණු නිවැරදි බවට නිර්දේශ කරමි.

————————,
ප්‍රාදේශීය ලේකම්
(නිල මුද්‍රාව)

දිනය :————.

පාසල් තේරීම් කමිටුවේ සාමාජිකයන්ගේ විස්තර හා නිර්දේශය ːː-

| | නම | තනතුර | අත්සන | නිර්දේශ කරමි/නොකරමි |
|---|---|---|---|---|
| 1 | .............................. | ............ | ............ | ............ |
| 2. | .............................. | ............ | ............ | ............ |
| 3. | .............................. | ............ | ............ | ............ |

---

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,

ඉහත 1-5 දක්වා සඳහන් කර ඇති ලකුණු පාසල් තේරීම් කමිටුව මගින් පරීක්ෂා කළ බවත්, අනෙකුත් පෞද්ගලික තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි. එබැවින් .............................. ශිෂ්‍යයා/ශිෂ්‍යාව විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත කලාපීය තේරීම් කමිටුව වෙත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

එසේම ශිෂ්‍යත්වලාභියාගේ මව/පියා/භාරකරුගේ හවුල්කාරිත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි ආකාරයේ (විශේෂ බද්ධ ගිණුමක්) සක්‍රිය ගිණුමේ සහ මව/පියා/භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් මේ සමඟ අමුණා ඇත.

————,
විදුහල්පතිගේ අත්සන
(නිල මුද්‍රාව)

දිනය :————.

---

කලාප කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා,

කලාපයේ තේරීම් කමිටුවේ සාමාජිකයන්ගේ විස්තර

| | නම | තනතුර | අත්සන |
|---|---|---|---|
| 1 | .............................. | ............ | ............ |
| 2. | .............................. | ............ | ............ |
| 3. | .............................. | ............ | ............ |

03-151

## සෞඛ්‍ය අමාත්‍යාංශය / සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතන සඳහා සෞඛ්‍ය රියදුරු තනතුරට බඳවා ගැනීම 2024 - විවෘත

සෞඛ්‍ය අමාත්‍යාංශය/සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනවල සෞඛ්‍ය රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.බඳවා ගැනීමේ ක්‍රමය :-

ලිඛිත පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලබන අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් අතුරින් ඔවුන් ලබාගන්නා ලද කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික හා වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික හා වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණු සහ වෘත්තීය පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

| | විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | මාර්ග නීති / මෝටර් කාර්මික දැනුම | 100 | 40% |
| | ප්‍රථමාධාර/රෝගී සත්කාර හා ප්‍රවාහන සේවා | 100 | 40% |
| වෘත්තීය පරීක්ෂණය | රිය පැදවීමේ නිපුණතා මැනීමේ පරීක්ෂණය | 100 | 40% |

2. අවශ්‍ය සුදුසුකම් :-

| | |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | අ.පො.ස(සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම |
| වෘත්තීය සුදුසුකම් | 1 A ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය. (වත්මන් රියදුරු බලපත්‍රයේ C හා D කාණ්ඩ සහිත) |
| පළපුරුද්ද | 1 A ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබාගැනීමෙන් පසු (වත්මන් රියදුරු බලපත්‍රයේ C හා D කාණ්ඩ සහිත) අවම වශයෙන් වසර 05 ක රියදුරු තනතුරක සේවා පළපුරුද්දක් තිබිය යුතුය (සහතික මඟින් සනාථ කළ යුතුය) |
| කායික සුදුසුකම් | I. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් දිවා රාත්‍රී කාලයේ රාජකාරි සඳහා සුදුසු තත්වයක සිටිය යුතු අතර අවශ්‍යතාවය මත පැය 24 ම සේවා මුර වලට රාජකාරි සඳහා සුදුසු තත්වයක සිටිය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>II. අවම උස අඩි 05 යි අඟල් 2 1/2 ක් විය යුතුය.<br>III. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමානවල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>අ). බර වාහන රියදුරන් බඳවා ගැනීමේදී ඇස් පෙනීම සම්බන්ධයෙන් ලංකා අක්ෂි වෛද්‍ය සංගමය විසින් පිළිගත් නිර්ණායක වන වම් ඇස හා දකුණු ඇස 6/9 සීමාව තුළ පැවතිය යුතුය.<br>ආ). වර්ණ අන්ධතාවය පරීක්ෂා කිරීමේ අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය. |
| වෙනත් | I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.<br>II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. තම පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව චරිත සහතිකයක් හා ප්‍රදේශයේ (පූජ්‍ය පක්ෂය ඇතුළුව) පිළිගත් ප්‍රභූවරයෙකු ඇතුළුව චරිත සහතික 02 ක්<br>III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>මෙම තනතුර සඳහා අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි. |

3. සේවයේ නියුක්ත කරවීමේ හා සේවා කොන්දේසි :-

i. මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත්විය යුතුවේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
ii. මෙම පත්වීම අවුරුදු 3ක පරිවාස කාලයකට අයත්ය.
iii. වසර 3ක් ඇතුලත පළමු කාර්යක්ෂමතා විභාගය සමත්විය යුතුය.
iv. මෙම පත්වීම රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්වේ.
v. බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් උදාවුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

4. වයස් සීමාව :-
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු වියයුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

5. වැටුප් පරිමාණය :-
මෙම තනතුරට රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990/- මාසික වැටුප් පරිමාණයක් හිමිය. (PL - 03 2006 A)

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

6. අපේක්ෂකයින් තෝරාගැනීම හා අනන්‍යතාවය :-
සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය.
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

7. අයදුම්පත් 2024.03.28 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ (ප්‍රවාහන)
සෞඛ්‍ය අමාත්‍යාංශය
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10

8. අයදුම් කළ යුතු ක්‍රමය :-

i. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස්කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.
ii. අයදුම්පත් බහාලන කවරයේ වම්පස "සෞඛ්‍ය රියදුරු III වන ශ්‍රේණිය (විවෘත) බඳවාගැනීම - 2024" ලෙස සඳහන් කළ යුතුය.
iii. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු / සමාදාන විනිශ්වයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු / නීතීඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරී නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 273,060.60 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කල යුතුය.
iv. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

v. විවෘත අයදුම්කරුවන් සඳහා විභාග ගාස්තුව රු. 1,000.00 කි. ලංකා බැංකුවේ තැපෝබේන් ශාඛාවේ ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය නමින් ඇති ගිණුම් අංක 7040244 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි අංක 07 යටතේ ඇති කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ )

9. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධ කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

10. සාවද්‍ය තොරතුරු සැපයීම :-

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන්කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවාගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවාගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගවලට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

වෛද්‍ය පී.ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

සෞඛ්‍ය අමාත්‍යාංශය / සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතන සඳහා
සෞඛ්‍ය රියදුරු තනතුරට බඳවා ගැනීම 2024 - විවෘත

1. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :—————.
   1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
   1.3 සම්පූර්ණ නම (සිංහල අකුරින්) :—————.

2. 2.1 ලිපිනය (පෞද්ගලික - සිංහල අකුරින්) :—————.
   2.2 ලිපිනය (පෞද්ගලික - ඉංග්‍රීසි අකුරින්) :—————.

3. 3.1 උපන් දිනය : වර්ෂය :—————. මාසය :—————. දිනය :—————.
   3.2 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :—————. මාස :—————. දින :—————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

5. දුරකථන අංකය (ජංගම) :—————.
   (නිවස) :—————.

6. සුදුසුකම් (සහතික කරන ලද පිටපත් ඇමිණිය යුතුය) -
   6.1 අධ්‍යාපන සුදුසුකම් :—————.
   6.2 වෘත්තීය සුදුසුකම් :—————.
   6.3 පළපුරුද්ද :—————.

7. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය -
   7.1 විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.
   7.2 ලදුපත් අංකය හා දිනය :—————.
   7.3 ගෙවූ මුදල :—————.

ලංකා බැංකු ශාඛාවට මුදල් ගෙවූ රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න.

8. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුලත් යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයාගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙරනම් එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහ කරනු ලබන බවද, තෝරා ගතහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටද එකඟ වෙමි.

දිනය :————. අත්සන :————.

9. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම -

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මයා මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු මා ඉදිරිපිටදී . ............ දින ඔහුගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන

සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

03-150

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **මාර්තු** | 2024.03.01 | සිකුරාදා | 2024.02.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.03.07 | බ්‍රහස්පතින්දා | 2024.02.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.03.15 | සිකුරාදා | 2024.03.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.03.22 | සිකුරාදා | 2024.03.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.03.28 | බ්‍රහස්පතින්දා | 2024.03.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2024.04.05 | සිකුරාදා | 2024.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.10 | බදාදා | 2024.03.28 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.04.19 | සිකුරාදා | 2024.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.04.26 | සිකුරාදා | 2024.04.10 | බදාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2024.05.03 | සිකුරාදා | 2024.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.10 | සිකුරාදා | 2024.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.17 | සිකුරාදා | 2024.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.22 | බදාදා | 2024.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.31 | සිකුරාදා | 2024.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.